සැකසුම-පුෂ්පා දමයන්ති මිය
ර/බල/ රජවක විද්‍යාලය

# දැල් ගී ගායනය සහ දැල් ගී පිළිබඳ තොරතුරු.

ධීවර ජනතාව විසින් දැල් ඇදීමේදී ගායනා කැරනු ලබන ගීත විශේෂයකි දැල් ගීත.මේවා සාමූහිකව සිදුකරනු ලබන කාර්යයකි.මෙම කාර්යට සහභාගිවන සියලු දෙනාගේම ශක්තිය එක්වර යොදා ගැනීම සඳහාත්,ඇතිවන වෙහෙස මහන්සිය මඟහරවා ගැනීම සඳහාත්,සියලුම දෙනා අතර එකමුතු කම ඇතිකර ගැනීම වැනි විවිධ කරුණු මේවා නිර්මාණය වීමට බලපා ඇත.

පහත දැක්වෙන්නේ එවැනි දැල් ගීයකි.

සන්තානම් පල්ලි යන්න-ලේ ලකඩි ලේ ලෝ

පැලවියෙන් හැරිල යන්න- ලේ ලකඩි ලේ ලෝ

මැගි අක්කගෙ දුව සොබනා- ලේ ලකඩි ලේ ලෝ

ගහල කටුව මොනරි වාගෙ- ලේ ලකඩි ලේ ලෝ

<u>ස්වර ප්‍රස්ථාරය</u>

### ගීත ස්වර ප්‍රස්තාරය (මැදුම් තනි තිත)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| / | | / | | / | | / | |
| ප-ප | මගරි | ග-රි | සස- | ධ̣ස- | රිගරි | ස-- | ස-- |
| සන්තා | ඍනම් | පල්ලි | යන්න | ලේ්ss | ලකඩි | ලේ්ss | ලෝ්ss |
| ප-ප | මගරි | ග-රි | සස- | ධ̣ස- | රිගරි | ස-- | ස-- |
| පාඍල | වියෙන් | හැරිල | එන්න | ලේ්ss | ලකඩි | ලේ්ss | ලෝ්ss |
| පපප | මගරි | ගගරි | සස- | ධ̣ස- | රිගරි | ස-- | ස-- |
| මැගිඅ | ක්කගෙ | දුවසො | බනාs | ලේ්ss | ලකඩි | ලේ්ss | ලෝ්ss |
| පපප | මගරි | ග-රි | සස- | ධ̣ස- | රිගරි | ස-- | ස-- |
| ගහල | කටුව | මොනරි | වාsගෙ | ලේ්ss | ලකඩි | ලේ්ss | ලෝ්ss |

පැවරුම-

01.දැල් ගීතය නිවැරදිව ගායනය කිරීමට පුහුණු වන්න.

02.දැල් ගීතවල ලක්ෂණ පිළිබඳ  කරුණු 04ක් ලියන්න.

03.දැල් ගී පිළිබඳ කරුණු රැස්කර කුඩා පොත් පිංචක් සකස් කරන්න.